# සතිපතා ආර්ථික දර්ශක



## 2024 මාර්තු 01

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

# සතියේ සුවිශේෂී කරුණු

## මූර්ත අංශය

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2024 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 6.4හි සිට 2024 පෙබරවාරි මාසයේ දී සියයට 5.9 දක්වා පහළ ගියේය. ආහාර උද්ධමනය සියයට 3.5 ක් ලෙස වාර්තා වූ අතර ආහාර නොවන උද්ධමනය සියයට 7.0ක් ලෙස වාර්තා විය. තවද, කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, 2024 ජනවාරි මාසයේ පැවති සියයට 2.2හි සිට 2024 පෙබරවාරි මාසයේ දී සියයට 2.8 දක්වා ඉහළ ගියේය.

2024 ජනවාරි මාසයේ දී, ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ලෙස හඳුන්වනු ලබන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය මගින් පෙර මාසයට සාපේක්ෂව ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරයි.

සලකා බලන කාලපරිච්ඡේදය (2024.02.24 සිට 2024.03.01 දක්වා කාලය) තුළ දී බොරතෙල් මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මැදපෙරදිග භූ දේශපාලනික අර්බුද තීව්‍ර වීම, ඔපෙක් සංවිධානය සහ සහාය දක්වන අනෙකුත් රටවල් විසින් 2024 වසරේ දෙවන කාර්තුව දක්වා තම නිෂ්පාදනය සීමා කිරීම දීර්ඝ කිරීම පිළිබඳ සලකා බැලීම සහ එක්සත් ජනපද පොලී අනුපාතික, අපේක්ෂිත කාලය ඉක්මවා තවදුරටත් ඉහළ අගයක පවතිනු ඇතැයි ඉඟි පළවීම හේතුවෙන් බොරතෙල් මිල ගණන් ඉහළ ගියේ ය. සමස්තයක් ලෙස, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි දෙවර්ගයේ ම බොරතෙල් බැරලයක මිල ගණන්, එක්සත් ජනපද ඩොලර් 2.35කින් ඉහළ ගියේ ය.

## මුදල් අංශය

සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පෙර සතිය හා සැසඳීමේ දී 2024 මාර්තු මස 01 වන දිනෙන් අවසාන වන සතිය සඳහා පදනම් අංක 08කින් සියයට 11.42ක් දක්වා පහළ ගියේය.

වාණිජ බැංකු සතු තැන්පතු ප්‍රමාණය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන පසුගිය සතියට සාපේක්ෂව සංචිත මුදල් ඉහළ යන ලදී.

සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව පෙර සතියේ අග පැවති රුපියල් බිලියන 53.907ක හිඟයට සාපේක්ෂව මෙම සතියේ දී රුපියල් බිලියන 91.697ක හිඟයක් විය.

පසුගිය සතිය හා සැසඳීමේ දී 2024 මාර්තු මස 01 දින වන විට, සමස්ත කොටස් මිල දර්ශකය සියයට 0.34කින් දර්ශක අගය 10,691.24ක් දක්වා ඉහළ ගිය අතර, එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 0.83කින් දර්ශක අගය 3,039.40ක් දක්වා පහළ ගියේය.

## රාජ්‍ය මූල්‍ය අංශය

මෙම සතිය තුළ දී , භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික ප්‍රාථමික වෙළඳපොළේ දී සුළු ඉහළ යාමක් සහ ද්විතීයික වෙළඳපොළේ දී ඵලදා අනුපාතික යම් පහළ යාමක් නිරීක්ෂණය විය. මේ අතර,භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ද්විතීයික වෙළඳපොල තුළ මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කරන ලදී.

පසුගිය සතියට සාපේක්ෂව, මෙම සතිය තුළ දී අනේවාසිකයන් සතු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණයෙහි රුපියල් අගය සියයට 5.62ක අඩුවීමක් පෙන්නුම් කර ඇත.

මෙම සතිය තුළ දී පවත්වන ලද භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිය සඳහා ලැබුණු මුළු ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය මෙන් 1.61 ගුණයකි.

පසුගිය සතියට සාපේක්ෂව මෙම සතිය තුළ දී භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මුළු ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය සියයට 23.30ක ප්‍රතිශතයකින් පහළ යාමක් දක්නට ලැබේ.

## විදේශීය අංශය

2024 වසරේ මාර්තු 01වන දින දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 4.5කින් අතිප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකවල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල, ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 11.2කින්, ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 5.4කින්, යුරෝවලට සාපේක්ෂව සියයට 7.0කින් සහ ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 4.2කින් අතිප්‍රමාණය විය.

2024 වසරේ ජනවාරි මස අවසානයට දළ නිල සංචිත ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 4,496ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. එක්සත් ජනපද ඩොලර් බිලියන 1.4කට පමණ සමාන වූ චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් මෙහි අන්තර්ගත වන අතර, එය භාවිතා කිරීමේ කොන්දේසි වලට යටත් වේ.

2024 වසරේ ජනවාරි මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 971ක් දක්වා සියයට 0.8කින් සුළු වශයෙන් පහළ ගිය අතර, මේ සඳහා අපනයන කාණ්ඩ අතරින් රෙදිපිළි හා ඇඟලුම් (-10.2%), යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ (-21.3%), සත්ත්ව ආහාර (-46.3%) සහ කුළුබඩු (-18.2%) අපනයන ආදායම් පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. 2024 වසරේ ජනවාරි මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලර් මිලියන 1,512ක් දක්වා සියයට 6.2කින් ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන්, මූල ලෝහ (243.4%), රෙදිපිළි හා රෙදිපිළි උපාංග (3.2%), රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (65.3%) සහ තිරිඟු හා ඉරිඟු (194.1%) ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය. ඒ අනුව, 2024 වසරේ ජනවාරි මාසයේ දී වෙළඳ හිඟය, 2023 වසරේ අනුරූප මාසයේදී වාර්තා වූ එක්සත් ජනපද ඩොලර් මිලියන 445ක සිට එක්සත් ජනපද ඩොලර් මිලියන 541ක් දක්වා පුළුල් විය.

සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩවල අපනයන මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී අපනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 4.9කින් පහළ ගියේය. 2024 වසරේ ජනවාරි මාසයේ දී ආනයන මිල දර්ශකය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 1.4කින් සුළු වශයෙන් පහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් පහළ යෑම හේතු විය. මේ අනුව, 2024 වසරේ ජනවාරි මාසයේ දී වෙළඳ මිල අනුපාතය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දර්ශකාංක 84.4ක් දක්වා සියයට 3.6කින් පහළ ගියේය.

තේ සඳහා වෙන්දේසි මිලෙහි සාමාන්‍යය (කොළඹ තේ වෙන්දේසියෙහි මිල) 2023 වසරේ ජනවාරි මාසයේ පැවති කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 4.10 සිට 2024 වසරේ ජනවාරි මාසයේ දී කිලෝග්‍රෑමයට එක්සත් ජනපද ඩොලර් 4.00ක් දක්වා පහළ ගියේය. 2024 වසරේ ජනවාරි මාසයේ දී බොරතෙල් සඳහා වූ ආනයන මිලෙහි සාමාන්‍යය, බැරලයකට එක්සත් ජනපද ඩොලර් 91.48ක් දක්වා සියයට 6.6කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) පහළ ගියේය.


# මූර්ත අංශය

## 1.1 මිල දර්ශක


| ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) (2021=100) | 2023 ජන. | 2023 දෙසැ. | 2024 ජන. |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 201.8 | 208.8 | 215.0 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.7 | 1.4 | 3.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 16.5 | 13.4 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 53.2 | 4.2 | 6.5 |
| මූලික උද්ධමනය - ( ජා. පා. මි. ද. ) | 189.8 | 189.7 | 193.9 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 15.8 | 12.3 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 52.0 | 0.9 | 2.2 |

| කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2021=100) | 2023 පෙබ. | 2024 ජන. | 2024 පෙබ. |
|---|---|---|---|
| මතුපිට උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 189.5 | 200.7 | 200.6 |
| මාසික ප්‍රතිශත වෙනස % | 0.5 | 2.9 | 0.0 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 14.2 | 11.3 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 50.6 | 6.4 | 5.9 |
| මූලික උද්ධමනය - ( කො. පා. මි. ද. ) | 172.3 | 176.2 | 177.2 |
| වාර්ෂික සාමාන්‍ය ප්‍රතිශත වෙනස % | - | 11.3 | 8.5 |
| ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස % | 43.6 | 2.2 | 2.8 |

ජා.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




කො.පා.මි.ද. ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.2 මිල

### 1.2.1 පිටකොටුව වෙළඳපොළ

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
|---|---|---|---|---|---|---|---|---|
| සම්බා | 207.50 | 238.00 | 233.00 | 233.00 | 224.50 | 255.00 | 250.00 | 250.00 |
| රතු කැකුළු | 174.00 | 173.67 | 175.00 | 177.00 | 183.75 | 200.00 | 190.00 | 190.00 |
| | | | | | | | | |
| බෝංචි | 317.50 | 550.00 | 512.50 | 418.00 | 367.50 | 600.00 | 562.50 | 468.00 |
| ගෝවා | 52.50 | 543.33 | 400.00 | 356.00 | 105.00 | 600.00 | 450.00 | 406.00 |
| කැරට් | 120.00 | 1,133.33 | 415.00 | 424.00 | 160.00 | 1,233.33 | 472.50 | 474.00 |
| තක්කාලි | 150.00 | 600.00 | 762.50 | 562.00 | 200.00 | 650.00 | 850.00 | 612.00 |
| වට්ටක්කා | 80.00 | 196.67 | 280.00 | 250.00 | 120.00 | 240.00 | 332.50 | 300.00 |
| පතෝල | 150.00 | 343.33 | 222.50 | 242.00 | 200.00 | 400.00 | 272.50 | 292.00 |
| වම්බටු | 235.00 | 516.67 | 150.00 | 162.00 | 285.00 | 566.67 | 200.00 | 212.00 |
| අමු මිරිස් | 337.50 | 1,066.67 | 637.50 | 626.00 | 387.50 | 1,166.67 | 687.50 | 676.00 |
| දෙහි | 100.00 | 130.00 | 110.00 | 120.00 | 137.50 | 200.00 | 165.00 | 180.00 |
| | | | | | | | | |
| රතු ළූණු ( දේශීය) | 304.25 | 350.00 | 253.25 | 236.60 | 400.00 | 400.00 | 350.00 | 350.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 101.25 | 314.33 | 362.75 | 365.00 | 120.00 | 400.00 | 443.75 | 450.00 |
| අර්තාපල් ( දේශීය) | 258.75 | 325.00 | 341.50 | 344.00 | 267.50 | 360.00 | 377.50 | 368.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,141.00 | 950.00 | 837.50 | 840.00 | 1,470.00 | 1,100.00 | 1,000.00 | 1,000.00 |
| රතු පරිප්පු | 342.50 | 300.00 | 295.00 | 295.00 | 375.00 | 320.00 | 320.00 | 320.00 |
| බිත්තර-සුදු ( ඒකක මිල) | 44.00 | 56.00 | 56.50 | 55.60 | 44.00 | 56.50 | 57.00 | 56.10 |
| පොල් ( ගෙඩියක මිල) | 95.00 | 90.00 | 91.00 | 92.00 | 120.00 | 120.00 | 120.00 | 120.00 |

### 1.2.2 මරදගහමුල සහල් මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සහල් තොග මිල ගණන්හි සාමාන්‍යය පසුගිය වසර | පසුගිය මාසය | පසුගිය සතිය | මෙම සතිය |
|---|---|---|---|---|
| සම්බා | 194.50 | 226.33 | 228.00 | 227.20 |
| සුදු කැකුළු | 174.50 | 192.00 | 187.75 | 189.00 |
| රතු කැකුළු | 179.50 | 181.00 | 172.75 | 171.80 |
| නාඩු | 180.00 | 193.00 | 188.00 | 191.20 |

ලැ.නො. - ලැබී නොමැත.


## 1.2.3 දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය


| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | තොග මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | 260.00 | 260.00 |
| රතු කැකුළු | 180.00 | 180.00 |
| බෝංචි | 511.25 | 407.00 |
| ගෝවා | 316.25 | 309.00 |
| කැරට් | 372.50 | 351.00 |
| තක්කාලි | 608.75 | 382.00 |
| වට්ටක්කා | 247.50 | 236.00 |
| පතෝල | 196.25 | 167.00 |
| වම්බටු | 137.50 | 105.00 |
| අළු කෙසෙල් | 237.50 | 235.00 |
| රතු ළූණු ( දේශීය) | 228.75 | 218.33 |
| රතු ළූණු ( ආනයනික) | 213.75 | 227.00 |
| ලොකු ළූණු ( ආනයනික) | 352.50 | 353.00 |
| අර්තාපල් (දේශීය) | 273.75 | 242.50 |
| අර්තාපල් ( ආනයනික) | 112.00 | 125.20 |
| වියළි මිරිස් ( ආනයනික) | 841.25 | 841.00 |
| පොල් ( ගෙඩියක මිල) | 75.75 | 76.20 |


## 1.2.4 නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය

| අයිතමය (කිලෝ ග්‍රෑමයට රුපියල්) | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
|---|---|---|
| | පසුගිය සතිය | මෙම සතිය |
| සම්බා | ලැනො. | ලැනො. |
| රතු කැකුළු | 182.50 | 185.00 |
| බෝංචි | 550.00 | 600.00 |
| ගෝවා | 595.00 | 580.00 |
| කැරට් | 475.00 | 580.00 |
| තක්කාලි | 1,100.00 | 760.00 |
| වට්ටක්කා | 375.00 | 356.00 |
| පතෝල | 420.00 | 344.00 |
| වම්බටු | 250.00 | 300.00 |
| අමු මිරිස් | 1,000.00 | 800.00 |
| රතු ළූණු ( දේශීය) | ලැනො. | ලැනො. |
| ලොකු ළූණු ( ආනයනික) | 430.00 | 404.00 |
| අර්තාපල් ( දේශීය) | 480.00 | 480.00 |
| අර්තාපල් ( ආනයනික) | 180.00 | 172.00 |
| වියළි මිරිස් ( ආනයනික) | 1,000.00 | 980.00 |
| රතු පරිප්පු | 320.00 | 311.20 |
| සුදු සීනි | 280.00 | 269.60 |
| බිත්තර- සුදු ( එකක මිල) | 56.00 | 55.00 |
| පොල් ( ගෙඩියක මිල) | 130.00 | 130.00 |

### නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානය - සිල්ලර මිල











## 1.2.5 මාළු වෙළඳපොළ


| | පෑලියගොඩ | | මීගමුව | | | | නාරාහේන්පිට | |
|---|---|---|---|---|---|---|---|---|
| | තොග මිල ගණන්හි සාමාන්‍යය | | තොග මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | | සිල්ලර මිල ගණන්හි සාමාන්‍යය | |
| | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය | පසුගිය සතිය | මෙම සතිය |
| කෙලවල්ලා | 1,212.50 | 1,210.00 | 1,083.33 | 1,030.00 | 1,646.67 | 1,524.00 | 2,070.00 | 2,140.00 |
| බලයා | 612.50 | 600.00 | 683.33 | 575.00 | 866.67 | 765.00 | 957.50 | 720.00 |
| සාලයා | 295.00 | 334.00 | 277.50 | 360.00 | 422.50 | 482.00 | 395.00 | 500.00 |
| හුරුල්ලා | 800.00 | 900.00 | 777.50 | 804.00 | 950.00 | 984.00 | 1,030.00 | 1,100.00 |

ලැනො. - ලැබී නොමැත.

## 1.3 කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) - එකතු කළ අගය මත වර්ධන අනුපාතිකය

| අයිතමය | වාර්ෂික | | තෙවන කාර්තුව | |
|---|---|---|---|---|
| | 2021 (අ)(ආ) | 2022 (ආ) | 2022(අ)(ආ) | 2023 (ආ) |
| කෘෂිකාර්මික | 0.9 | (4.6) | (6.7) | 3.0 |
| කාර්මික | 5.7 | (16.0) | (21.3) | 0.3 |
| සේවා | 3.5 | (2.0) | (4.2) | 1.3 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු -සහනාධාර | (3.6) | (27.1) | (38.7) | 13.6 |
| දළ දේශීය නිෂ්පාදිතය | 3.5 | (7.8) | (11.5) | 1.6 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.4 කෘෂිකාර්මික නිෂ්පාදනය

| අයිතමය | දෙසැම්බර් | | % වෙනස |
|---|---|---|---|
| | 2022 (අ) | 2023 (අ) | |
| තේ (කි.ග්‍රෑ. මිලියන) | 19.7 | 19.8 | 0.5 |
| රබර් (කි.ග්‍රෑ. මිලියන) | 6.7 | 3.4 | (48.9) |
| පොල් (ගෙඩි මිලියන) | 271.3 | 254.1 | (6.4) |

(අ) තාවකාලික





මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
රබර් සංවර්ධන මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය

## 1.5 කාර්මික නිෂ්පාදන දර්ශකය (කා.නි.ද) (2015=100) (අ)

| අයිතමය | දෙසැම්බර් | | % වෙනස |
|---|---|---|---|
| | 2022 (ආ) | 2023 (ඇ) | |
| කාර්මික නිෂ්පාදන දර්ශකය | 80.2 | 87.2 | 8.8 |
| ආහාර නිෂ්පාදන | 90.1 | 85.4 | (5.2) |
| ඇඟලුම් නිෂ්පාදන | 90.2 | 83.7 | (7.2) |
| අනෙකුත් ලෝහ නොවන ඛනිජ නිෂ්පාදන | 85.8 | 91.7 | 6.9 |
| පිරිපහදුකළ ඛනිජතෙල් නිෂ්පාදන | 36.8 | 114.2 | 210.1 |
| රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 70.2 | 76.5 | 9.1 |
| රසායනික ද්‍රව්‍ය සහ රසායනික ද්‍රව්‍ය ආශ්‍රිත නිෂ්පාදන | 63.8 | 64.8 | 1.6 |
| පාන වර්ග | 119.6 | 130.4 | 9.1 |

(අ) ප්‍රධාන උප අංශ 7
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## 1.6 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - නිෂ්පාදන | 2022 | 2023 | | 2024 |
|---|---|---|---|---|
| | දෙසැ. | ජන. | දෙසැ. | ජන. |
| දර්ශකය | 44.8 | 40.8 | 52.7 | 55.6 |


| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - සේවා | 2022 | 2023 | | 2024 |
|---|---|---|---|---|
| | දෙසැ. | ජන. | දෙසැ. | ජන. |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය | 54.0 | 51.5 | 71.0 | 60.1 |

| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - ඉදිකිරීම් | 2022 | 2023 | | 2024 |
|---|---|---|---|---|
| | දෙසැ. | ජන. | දෙසැ. | ජන. |
| සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය | 32.9 | 36.5 | 48.6 | 52.9 |

(අ) පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, සේවා සහ ඉදිකිරීම් ක්‍රියාකාරකම් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ මූලික දර්ශක ලෙස පිළිවෙළින්, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය සැලකෙන අතර, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, උප-දර්ශක පහක හරිත සාමාන්‍යයක් ලෙස ගණනය කරනු ලැබේ. තවද, සේවා අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සහ ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය හා සැසඳිය හැකිය.







## 1.7 සේවා නියුක්තිය [(අ)]

| අයිතමය | 2022 | 2023 කාර්තු:2 | 2023 කාර්තු:3 |
|---|---|---|---|
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය | 49.8 | 48.6 | 48.8 |
| සේවා වියුක්ති අනුපාතිකය | 4.7 | 5.2 | 4.7 |

**අංශය අනුව සේවා නියුක්ත පුද්ගලයන්[(ආ)] (මුළු සේවා නියුක්තියෙන් ප්‍රතිශතයක් ලෙස)**


| | 2022 | 2023 කාර්තු:2 | 2023 කාර්තු:3 |
|---|---|---|---|
| කෘෂිකර්මාන්ත | 26.5 | 25.7 | 25.4 |
| කර්මාන්ත | 26.5 | 26.3 | 25.0 |
| සේවා | 47.0 | 48.1 | 49.6 |




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 1.8 වැටුප් ප්‍රමාණ දර්ශක


| අයිතමය | 2023 ජන. | 2024 ජන. | වෙනස % |
|---|---|---|---|
| රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016 = 100) - නාමික | 133.1 | 147.2 | 10.6 |
| අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018 = 100) - නාමික | 166.3 | 177.9 | 7.0 |
| කෘෂිකර්මාන්ත | 167.9 | 176.7 | 5.3 |
| කර්මාන්ත | 166.1 | 178.0 | 7.2 |
| සේවා | 165.1 | 179.1 | 8.5 |





## 1.9 බොරතෙල් සාමාන්‍ය මිල

| මාසය | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2023 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2023 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) (ඇ) (ඈ) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) බ්‍රෙන්ට් (පාදක මිල) | 2024 ඉදිරි වෙළඳපොළ මිල (බැරලයක් එ.ජ. ඩොලර්) ඩබ්ලිව්.ටී.අයි. (පාදක මිල) | 2024 ලං.ඛ.නී.සං. ආනයන මිල (මි.ර.ගැ.) (බැරලයක් එ.ජ. ඩොලර්) |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | 84.28 | 78.60 | 97.93 | 78.93 | 73.64 | 91.48 |
| පෙබරවාරි | 83.52 | 76.97 | - | 81.48 | 76.53 | |
| මාර්තු | 78.93 | 73.05 | 84.05 | | | |
| අප්‍රේල් | 83.09 | 79.10 | 90.49 | | | |
| මැයි | 76.05 | 72.05 | 86.90 | | | |
| ජූනි | 74.85 | 70.13 | 90.90 | | | |
| ජූලි | 79.90 | 75.52 | 81.29 | | | |
| අගෝස්තු | 85.09 | 81.28 | 81.53 | | | |
| සැප්තැම්බර් | 91.89 | 88.72 | - | | | |
| ඔක්තෝබර් | 89.19 | 86.16 | 88.98 | | | |
| නොවැම්බර් | 82.22 | 77.58 | 99.98 | | | |
| දෙසැම්බර් | 77.53 | 72.36 | 97.62 | | | |

| දිනය | 2023 | | 2024 | |
|---|---|---|---|---|
| 24-02 | 82.68 | 75.91 | - | - |
| 25-02 | - | - | - | - |
| 26-02 | - | - | 81.27 | 76.14 |
| 27-02 | 83.13 | 76.34 | 82.60 | 77.67 |
| 28-02 | 82.32 | 75.71 | 83.33 | 78.54 |
| 29-01 | - | - | 83.57 | 78.44 |
| 01-03 | - | - | 83.62 | 78.49 |





මූලයන්: බ්ලූම්බර්ග් තොරතුරු සේවය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

## 1.10 දෛනික විදුලිබල උත්පාදනය

| | 2024-02-26 | 2024-02-27 | 2024-02-28 | 2024-02-29 |
|---|---|---|---|---|
| උපරිම ඉල්ලුම (මෙ. වො.) | 2,388.70 | 2,470.00 | 2,483.20 | 2,519.50 |
| මුළු උත්පාදනය (ගි. වො. පැ) | 46.70 | 46.92 | 47.65 | 47.85 |
| ජල | 11.86 | 13.84 | 11.22 | 11.29 |
| ගල් අඟුරු | 19.45 | 19.53 | 19.56 | 19.51 |
| තෙල් | 10.60 | 9.77 | 12.47 | 12.84 |
| සුළං | 2.34 | 1.49 | 1.92 | 1.72 |
| සූර්ය (තොග) | 2.17 | 2.11 | 2.13 | 2.19 |
| ජෛව ස්කන්ධය | 0.27 | 0.18 | 0.34 | 0.30 |




(අ) කුටුම්භ ජනගහනය අවුරුදු 15 සහ ඊට වැඩි
(ආ) ජාත්‍යන්තර ප්‍රමිති වර්ගීකරණ 4 වන සංශෝධනය මත පදනම් වේ.
(ඇ) ලං.ඛ.නී.සං. ආනයන මිල ගණන්වලට ගැල් කුලී ඇතුළත් වීම සහ එය විවිධ බොරතෙල් වර්ගවල සාමාන්‍ය මිල ගණන් අනුව බර තබන ලද මිලක් වන බැවින් ලං.ඛ.නී.සං. ආනයන මිල, බ්‍රෙන්ට් සහ ඩබ්ලිව්.ටී.අයි. ඉදිරි වෙළඳපොළ මිල ගණන් සමඟ ඍජුව සැසඳිය නොහැකිය. එසේම, ලං.ඛ.නී.සං. ආනයනවලින් කොටසක් කාලීන ගිවිසුම් මත පදනම් වේ. 2023 වසරේ පෙබරවාරි සහ සැප්තැම්බර් යන මාසවල දී බොරතෙල් ආනයනය කර නැත.
(ඈ) තාවකාලික

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

# මුදල් අංශය

## 2.1 පොලී අනුපාතික (වාර්ෂික අනුපාතය ප්‍රතිශතයක් ලෙස)

| ප්‍රතිපත්ති පොලී අනුපාතික | වසරකට පෙර | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 14.50 | 9.00 | 9.00 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 15.50 | 10.00 | 10.00 |
| **ඒක්ෂණ මුදල් වෙළඳපොළ** | | | |
| බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) (සතිපතා සාමාන්‍යය) | 15.42 | 9.21 | 9.19 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | |
| දින 91 | 29.59 | 9.78 | 9.87 |
| දින 182 | 28.64 | 9.86 | 9.95 |
| දින 364 | 27.64 | 10.02 | 10.05 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු** | | | |
| බරිත සාමාන්‍යය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR) | 23.45 | 11.50 | 11.42 |

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය
(සතිපතා සාමාන්‍යය)




| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25 - 6.00 | 0.25 - 13.00 | 0.25 - 13.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 4.50 - 30.00 | 1.00 - 22.00 | 1.00 - 22.00 |

| | 2023 පෙබරවාරි | 2024 ජනවාරි | 2024 පෙබරවාරි |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 14.74 | 11.15 | 10.80 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 19.23 | 14.28 | 13.77 |

| | 2023 ජනවාරි | 2023 දෙසැම්බර් | 2024 ජනවාරි |
|---|---|---|---|
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 22.24 | 11.06 (අ) | 10.86 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 22.78 | 11.33 (අ) | 11.12 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) | 18.66 | 14.21 | 13.88 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR) | 25.82 | 14.38 | 13.91 |

| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් |
|---|---|---|---|
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | 3.00 | 3.00 |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 12.00 | 8.50 | 8.00 |

| භාණ්ඩාර බැඳුම්කර වෙන්දේසිය | වසර 02 මාස 10 2024 පෙබ. 13 | වසර 04 මාස 10 2024 පෙබ. 13 |
|---|---|---|
| පොලී අනුපාතිකය | 11.25 | 11.50 |
| බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය | 10.81 | 11.90 |


**බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය බැංකු අනුව**


| | සතියකට පෙර | මෙම සතිය | | සතියකට පෙර | මෙම සතිය |
|---|---|---|---|---|---|
| ලංකා බැංකුව | 11.92 | 11.79 | කාර්ගිල්ස් බැංකුව | 11.98 | 12.11 |
| මහජන බැංකුව | 10.93 | 11.21 | එච්එස්බීසී බැංකුව | 11.96 | 11.72 |
| හැටන් නැෂනල් බැංකුව | 11.47 | 10.94 | ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව | 11.03 | 11.55 |
| කොමර්ෂල් බැංකුව | 11.36 | 11.06 | සිටි බැංකුව | 11.95 | 12.69 |
| සම්පත් බැංකුව | 12.40 | 11.31 | ඩොයිෂ් බැංකුව | 11.33 | 11.96 |
| සෙලාන් බැංකුව | 13.69 | 13.00 | හබීබ් බැංකුව (ආ) | 12.43 | 12.43 |
| යූනියන් බැංකුව | 11.44 | 11.24 | ඉන්දියන් බැංකුව | 12.94 | 12.94 |
| පෑන් ඒෂියා බැංකුව | 11.34 | 11.33 | ඉන්දියන් ඕවර්සීස් බැංකුව | 12.44 | 12.44 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකුව | 11.52 | 11.44 | එම්සීබී බැංකුව | 12.44 | 11.53 |
| ඩීඑෆ්සීසී බැංකුව | 14.08 | 14.55 | ඉන්දීය රාජ්‍ය බැංකුව | 12.00 | 11.01 |
| එන්ඩීබී බැංකුව | 11.67 | 11.68 | පබ්ලික් බැංකුව | 11.11 | 14.03 |
| අමානා බැංකුව | 10.80 | 10.75 | බැන්ක් ඔෆ් චයිනා | - | - |


(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක දත්ත සංශෝධනයක් හේතුවෙන් සංශෝධනය කර ඇත.
(ආ) බැංකුව විසින් මෙම සතිය තුළ දී ප්‍රමුඛ ගණුදෙනුකරුවන් හට කිසිදු ණය පහසුකමක් ලබා දී නොමැත. එබැවින් ආසන්නතම සතියට අදාළ ණය අනුපාතිකය සඳහන් කර ඇත.

## 2.2 මුදල් සැපයුම

| | රු. බිලියන | | | වාර්ෂික වෙනස (%) | | |
|---|---|---|---|---|---|---|
| | දෙසැම්බර් 2022[අ] | නොවැම්බර් 2023[අ] | දෙසැම්බර් 2023[ආ] | දෙසැම්බර් 2022[අ] | නොවැම්බර් 2023 [අ] | දෙසැම්බර් 2023[ආ] |
| සංචිත මුදල් | 1,349.4 | 1,411.2 | 1,328.7 | 3.3 | 7.0 | -1.5 |
| පටු මුදල් සැපයුම (M1) | 1,453.6 | 1,507.0 | 1,658.0 | -0.4 | 3.4 | 14.1 |
| පුළුල් මුදල් සැපයුම (M2) | 10,497.1 | 11,243.6 | 11,485.1 | 8.9 | 7.9 | 9.4 |
| ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) | 12,289.6 | 12,929.5 | 13,189.1 | 15.4 | 6.3 | 7.3 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම්[ඇ] | -1,766.8 | -572.3 | -456.1 | -79.9 | 69.4 | 74.2 |
| මුදල් අධිකාරීන් | -1,613.9 | -887.1 | -837.3 | -316.7 | 45.9 | 48.1 |
| වාණිජ බැංකු | -153.0 | 314.8 | 381.2 | 74.3 | 236.6 | 349.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | -433.5 | -320.7 | -262.5 | -13.6 | 38.7 | 39.4 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 280.5 | 635.5 | 643.8 | 231.6 | 117.0 | 129.5 |
| බැංකු පද්ධතිය සතු ශුද්ධ දේශීය වත්කම්[ඇ] | 14,056.4 | 13,501.8 | 13,645.2 | 20.9 | -3.8 | -2.9 |
| රජයේ ණය ගැනීම් (ශුද්ධ)[ඈ] | 7,471.1 | 7,722.5 | 8,285.0 | 28.1 | 5.9 | 10.9 |
| මහ බැංකුව | 3,432.5 | 2,317.4 | 2,376.2 | 63.9 | -31.2 | -30.8 |
| වාණිජ බැංකු | 4,038.6 | 5,405.1 | 5,908.8 | 8.0 | 37.8 | 46.3 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 3,639.3 | 5,174.8 | 5,689.3 | 8.3 | 47.9 | 56.3 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 399.3 | 230.4 | 219.4 | 5.9 | -45.6 | -45.1 |
| රාජ්‍ය සංස්ථාවලට දෙන ලද ණය[ඈ] | 1,749.7 | 1,125.4 | 769.8 | 47.3 | -36.1 | -56.0 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 1,689.4 | 1,067.0 | 712.3 | 73.7 | -37.2 | -57.8 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 60.3 | 58.4 | 57.5 | -72.0 | -6.1 | -4.7 |
| පෞද්ගලික අංශයට දෙන ලද ණය | 7,411.5 | 7,263.9 | 7,366.4 | 6.2 | -3.1 | -0.6 |
| දේශීය බැංකු ඒකක (DBUs) | 6,732.3 | 6,737.8 | 6,834.8 | 3.6 | -1.0 | 1.5 |
| අක්වෙරළ බැංකු ඒකක (OBUs) | 679.1 | 526.1 | 531.6 | 40.7 | -24.5 | -21.7 |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,575.8 | -2,609.9 | -2,776.0 | -8.6 | -3.6 | -7.8 |





## 2.3 සංචිත මුදල්හි සතිපතා වෙනස

| | 2024-02-21 | 2024-02-29 | වෙනස |
|---|---|---|---|
| සංචිත මුදල් (රුපියල් මිලියන) | 1,355,798.44 | 1,413,718.36 | 57,919.92 |




## 2.4 මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් (දෛනික)

| ඒක්ෂණ මුදල් වෙළඳපොළ | 2024-02-26 | 2024-02-27 | 2024-02-28 | 2024-02-29 | 2024-03-01 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 9.16 | 9.14 | 9.19 | 9.21 | 9.24 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 11.60 | 1.08 | 25.24 | 9.45 | 20.55 |

| වෙළඳපොළ ප්‍රතිමිලදී ගැනුම් | 2024-02-26 | 2024-02-27 | 2024-02-28 | 2024-02-29 | 2024-03-01 |
|---|---|---|---|---|---|
| බරිත සාමාන්‍ය අනුපාතිකය (වාර්ෂික පොලී අනුපාතිකය සියයට) | 10.00 | 9.85 | 9.77 | 9.46 | 9.22 |
| දළ වටිනාකම (රුපියල් බිලියන) | 7.09 | 7.22 | 5.29 | 8.50 | 14.58 |

## 2.5 ශ්‍රී ලංකා මහ බැංකුව සතු සුරැකුම්පත් ගොනුව

| | 2024-02-26 | 2024-02-27 | 2024-02-28 | 2024-02-29 | 2024-03-01 |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - මුහුණත අගය (රුපියල් බිලියන) | 2,716 | 2,716 | 2,716 | 2,716 | 2,716 |
| ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ප්‍රමාණය - පොත් අගය (රුපියල් බිලියන) | 1,592 | 1,592 | 1,592 | 1,593 | 1,596 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම (M2b) අදාළව
(ඈ) රජය සතු තෝරාගත් වාණිජ ව්‍යාපාරවල ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ එකඟ වූ ක්‍රියාමාර්ගවලට අනුකූලව 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී.ඒ අනුව, මෙම ගැළපීම් අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවේ ශේෂ පත්‍රයේ පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

## 2.6 විවට වෙළඳ කටයුතු

| අයිතමය | 2024 පෙබ. 26 | | 2024 පෙබ. 27 | | 2024 පෙබ. 28 | 2024 පෙබ. 29 | 2024 මාර්තු. 01 | |
|---|---|---|---|---|---|---|---|---|
| **කෙටි කාලීන වෙන්දේසි** | | | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | 40.00 | 50.00 | 30.00 | 70.00 | 50.00 | 50.00 | 40.00 | 40.00 |
| කාල සීමාව (දින ගණන) | 1 | 7 | 1 | 7 | 1 | 1 | 3 | 6 |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | 29.50 | 59.00 | 29.78 | 40.20 | 43.94 | 47.84 | 58.18 | 46.45 |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | 29.50 | 50.00 | 29.78 | 40.20 | 43.94 | 47.84 | 40.00 | 40.00 |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 9.05 | 9.25 | 9.05 | 9.15 | 9.06 | 9.06 | 9.08 | 9.30 |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | 9.75 | 9.94 | 9.30 | 9.75 | 9.30 | 9.50 | 9.25 | 9.60 |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | 9.22 | 9.74 | 9.13 | 9.50 | 9.13 | 9.17 | 9.18 | 9.41 |
| **ස්ථිර පදනම මත වෙන්දේසි** | | | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම (රු. බිලියන) | | | | | | | | |
| ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනුම් (රු. බිලියන) | | | | | | | | |
| පියවීමේ දිනය | | | | | | | | |
| පරිණත වන දිනය | | | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| **දිගු කාලීන වෙන්දේසි** | | | | | | | | |
| පිළිගත් ප්‍රතිමිලදී ගැනුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පියවීමේ දිනය | | | | | | | | |
| පරිණත වන දිනය | | | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පිළිගත් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| **ද්‍රවශීලතා පහසුකම් වෙන්දේසි** | | | | | | | | |
| පිරිනමන ලද ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පියවීමේ දිනය | | | | | | | | |
| පරිණත වන දිනය | | | | | | | | |
| කාල සීමාව (දින ගණන) | | | | | | | | |
| ලැබුණු ලංසු ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| පිළිගත් ප්‍රතිවිකුණුම් ප්‍රමාණය (රු. බිලියන) | | | | | | | | |
| අවම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| උපරිම පිළිගත් අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය (වා.පො.අ. සියයට) | | | | | | | | |
| **නිත්‍ය පහසුකම** | | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම (රු. බිලියන) | 17.510 | | 33.974 | | 4.450 | 42.067 | 127.678 | |
| නිත්‍ය ණය පහසුකම (රු. බිලියන) | 3.050 | | 1.335 | | 0.490 | 3.260 | 9.175 | |
| | | | | | | | | |
| **සමස්ත වෙළඳපොළ එක් දින ද්‍රවශීලතාව (රු. බිලියන)** | **(65.040)** | | **(37.341)** | | **(39.975)** | **(9.033)** | **38.503** | |
| **සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව (රු. බිලියන)**[අ] | **(222.840)** | | **(157.541)** | | **(160.175)** | **(129.233)** | **(91.697)** | |

(අ) සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාවෙන් නිරූපණය වන්නේ කෙටි කාලීන සහ දිගු කාලීන නොපියවූ ප්‍රතිමිලදීගැනුම්/ප්‍රතිවිකුණුම් ගණුදෙනු ගළපන ලද එක් දින ද්‍රවශීලතාවයි.

## 2.7 ණය කාඩ්පත් සහ වාණිජ පත්‍රිකා නිකුතු

### 2.7.1 ණය කාඩ්පත්[අ]


| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් [ආ] |
|---|---|---|---|
| මුළු සක්‍රිය කාඩ්පත් ගණන | 1,952,991 | 1,913,000 | 1,917,085 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 13,028 | 10,913 | 10,768 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 1,939,963 | 1,902,087 | 1,906,317 |
| නොපියවූ ශේෂය (රු. මිලියන) | 143,098 | 145,197 | 151,373 |
| දේශීය (දේශීය වශයෙන් පිළිගත් ඒවා පමණි) | 37,328 | 34,822 | 35,838 |
| ගෝලීය (ගෝලීය වශයෙන් පිළිගත්) | 105,770 | 110,375 | 115,534 |

### 2.7.2 වාණිජ පත්‍රිකා නිකුතු[ඇ]


| | 2022 දෙසැම්බර් | 2023 නොවැම්බර් | 2023 දෙසැම්බර් [ආ] |
|---|---|---|---|
| සමස්ත නිකුතුව (සමුච්චිත) - රු. බිලියන [ඈ] | 2.0 | 0.8 | 1.3 |
